


වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. කල්‍යාණ වසන්ත මහතා විසිනි




නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

කාලය හා වයස හේතු වී මරණයේ භය දැනෙන විදි

සංයුක්ත නිකාය - අවෙචනති සූත්‍රය ඇසුරෙනි




ධර්මකාමී පින්වතුනි,

අද ඉල් මස පසළොස්වක පොහොය දිනයයි. ශාසනික වශයෙන් වැදැගත් සිද්ධීන් රාශියක් සිහිපත් කරන දිනයකි. වස්කාලය අවසන් වීමෙන් පසු ප්‍රථම ධර්මදූත පිරිස අමතා අවවාද කොට ධර්මදූතයන් වහන්සේලා චාරිකාවට යොමු කිරීමද, තුන්බෑජටිලයන් දමනය කිරීම සඳහා උරුවෙල් දනව්වට වැඩම කිරීමද, අගසවු සැරියුත් මහරහතන් වහන්සේ පිරිනිවන් පෑමද, පසුවස් පවාරණයද කඨින චීවර පූජාව කළ හැකි අවසන් දිනය වීමද, මෙත් බෝසතුන් විවරණ ලැබීමද යන එම හේතූන් ඉල් පුර පෝදිනෙහි වැදගත් හේතූන් වෙති.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වසන දිනෙක රාත්‍රී එක්තරා දේවතාවෙක් පැමිණ ගාථාවකින් මෙසේ ප්‍රකාශ කරනවා.

"අච්චෙනතිකාලා තරයනති රතතියො
වයො ගුණා අනුපුබබං ජහනති
එතං භයං මරණෙ පෙකබමානො
පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති"

**" රෑ දහවල් කාලයෝ ගෙවීයති පුද්ගලයාගේ වයස ක්‍රමයෙන් ගෙවී යති මරණයේ ඇති මෙම බිය දකින්නා සැප ගෙනදෙන පින් කළ යුතුය "**

තථාගතයන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් දේවතාවාට දේශණා කරනව,

"අච්චෙනති කාලා තරයනති රතතියො
වයො ගූණා අනුපුබබං ජහනති
එතං භයං මරණෙ පෙකඛ මානො
ලෝකාමිසං පජහෙ සනති පෙකෙඛාති"

***"රෑ දහවල් කාලයෝ ගෙවීයති . පුද්ගලයා මරණය කරා පමුණුවති. මරණයේ ඇති මේ බිය දකින්නා ශාන්තිය හෙවත් නිවන් සැපය පැතිය යුතුය. ඒ සඳහා ලෝකාමිසය අත්හල යුතුය.***

*ගාථා දෙකෙන්ම කියනවා කාලය ක්‍රමයෙන් ගෙවීයද්දී පුද්ගලයා වියපත් වෙමින් වෙනස් වෙමින් ජරාවට පත්වෙමින් මරණය වෙතට ගෙනයන බව දේවතාවාගේ අදහස මරණයේ බිය තේරුම්ගත් පුද්ගලයා සැප සම්පත් ලගාකරදෙන පින් කළ යුතුයි කියා . බුදුහාමුදුරුවෝ කියනවා මරණයේ බිය දකින්නා ශාන්තිය පතන්නේ නම් ලොකාමිසය අත් හැරිය යුතුය කියලා.*

*මෙයින් පළමුව විමසා බලමු දේවතාවගේ ප්‍රකාශය . දේවතාවා දකින්නේ ඇසට පෙනෙන ලෞකික ලෝකය පිළිබඳවයි . මරණයේ බිය දකිනව එහෙත් එයින් මිදීමට ඔහු සිතන්නේ පිං කළ යුතු බවයි. " පුඤ්ඤානි කයිරාථ සුඛා වහානී" සැප ගෙනදෙන පිං කරන්න යනුවෙන් දැක්වේ. පිං කළාම සැප ලැබේද යන්න විමසිය යුතුයි. පින් පවු යනුවෙන් හැඳුන්වන්නේ ද කර්මයන්ය. "චේතනාහං භික්ඛවේ කම්මං " චේතනාවම කර්මයයි කියමි. සිතින් සිතා කයින් වචනයෙන් මනසින් කර්ම කරනවා, ඒවා පුණ්‍ය සහ පාප වශයෙන් දෙකට බෙදෙනවා අචේතනික ක්‍රියා කර්ම නොවන නිසා විපාක නොදේ. සචේතනික ක්‍රියා සඳහා ඊට අනුරූපව අනාගතයේදී දුක් සහ සැප වශයෙන් විපාක ලැබේ . එතකොට පින් යනු අනාගත සැප වේදනා ගෙනදෙන ප්‍රසන්න සිතින් කරන ක්‍රියායි. පින් කිරීමෙන් දෙව් මිනිස් ආදී කාමාවචර රූපාවචර අරූපාවචර සුගතිවල ඉපදීම ලබාදෙන ක්‍රියාවන්ය.*

*කාමලෝකවල බහුලව ලැබෙන්නේ පංචකාම සැපයයි. රූපාවචර ලෝකවල රූපාවචර ධ්‍යාන සැපයයි. අරූපාවචර ලෝක වල අරූපාවචර ධ්‍යාන සැපය ලැබේ. ඒ හැමතැනම ඉහත දෙවියා කියන පරිදි කාලය නැතිවීමක් වේද? මොන මොන විදියේ පිං කරත් ඊට අනුරූප වශයෙන් ලැබෙන සුගති වල මරණය පවතින බැවින් මරණ බියත් පවතිනවා.*

*එක භවයකින් දෙකකින් එය අවසන් වෙන්නෙත් නැහැ .නැවත නැවත ඇතිවෙනව. මෙසේ පටන් ගැනීමක් අවසානයක් සිතිය නොහැකි සත්වයන් අනන්තව ලෝකයේ ඇත. ජාතියෙන් ජාතිය නැවත නැවත උපදවා සත්වයන්ගේ ජාති පරම්පරාව හෙවත් භව පරම්පරාවට සංසාරය යයිද ව්‍යවහාර වේ. එබැවින් මරණ බියෙන් මිදීමක් ලෙස පින් විපාක හේතු නොවේ. පින් සහ පව් කිරීමෙන් සුඛ සහ දුක්ඛ, වේදනාවන් දැනෙනවා . වේදනාව කියන්නේ විඳීමක්. විඳීමක් නම් දුකක්බව "යං කිඤ්චි වේදයිතං සබ්බං තං දුක්ඛස්මිං වදාමී " විඳින්නේ යමක්ද එය දුකකි. එබැවින් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ විඳිමක් නිසා එය දුකකි. එයින් ජාති, ජරා, මරණ නැතිවෙන්නේද නැහැ.*

*එය එසේනම් පින් නොකළ යුතුද? පින් කළ යුතුමය. අප ශාන්තිය හෙවත් නිවන අපේක්ෂා කරන තුරු ජාති ජරා මරණයන්ගෙන් යුක්තවූ මේ ලෝකයේම විසිය යුතුයි. පරලොවට ඇති එකම පිහිට පිනයි. "පුඤ්ඤානි පරලෝකස්මිං පතිට්ඨා හොන්ති පාණිනං" ධර්මය වරදවා තේරුම් නොගැනීම මේ කාරණය පිළිබඳව සිතන්නාගේ වගකීමකි. ඒ බවද සිහියේ පැවතිය යුතුයි.*

*මීළගට තථාගතයන් වහන්සේ දේවාතාවට දේශණා කල කාරණය විමසා බලමු. උන්වහන්සේ මේ සඳහා පැහැදිලි විසඳුමක් දෙනව මොන සුගතියේ උපන්නත් ජාති ජරා, මරණයන්ට මුහුණ දීමට වෙනවානම් ඒ බිය දකින්නා එයින් මිදී ශාන්තිය හෙවත් නිවන අපේක්ෂා කරන්නේනම් කුමක් කළ යුතුද? " ලෝකාමිසං පජහෙ" ලෝකාමිසය අත්හළ යුතුයි. ලෝකාමිසය යනු කුමක්ද යමක පැවැත්මට අවශ්‍ය*

කරන යමක් වේනම් එය ඒ සඳහා අවශ්‍ය ආමිසයයි. ලෝකයේ පැවැත්මට අවශ්‍ය යමක් වේ නම් එය ලෝක ‍ ආමිසයයි. (ලොකාමිසය) ලෝකය යනු, බුදුහිමියන් දේශණා කොට ඇත්තේ බඹයක් පමණ ශරීරයටයි. උන්වහන්සේ ලෝක සමුදයත් (ලොව ඇති වීමට හේතුව) ලෝක නිරෝධයත් (ලොව නැතිකිරීම) ලෝක නිරෝධ ගාමිණී පටිපදාව (ලොව නැතිකරන මාර්ගය) යන සියල්ල ලෝකය හෙයින් සත්ව ශරීරය ලෝකය ලෙසින් පනවා ඇත.

කය නැමැති ලෝකය පවත්වන්නේ නම් ලෝකය පවතී. පවතින තරමට විඳී. විඳින තරමට දුකකි. දුක් දැනෙන තරමට බිය ඇතිවේ. එයින් මිදීම ශාන්තියයි. ලෝකය පැවැතීමට ප්‍රධාන වශයෙන් ආහාරයෙන් හටගත් බැවින් " ආහාර නෙතති පපභවං" ආහාර ප්‍රභව කොට ඇති හෙයින් ආහාර වස්ත්‍ර, නිවාස, බෙහෙත්, මේ ආදීය පමණක්ම නොව ජලය , වාතය (පරිසරය) ආදී හැම දෙයක්ම අවශ්‍ය වෙනව. මේ අපිට ඇසට පෙනෙන ආමිසයයි. දෙවියන් සිතුවෙ මෙතනට පමණයි. ඇසට නොපෙනෙන නොසිතන බුදු ඇසට පෙනෙන ආමිසයකුත් පවතිනවා. ඇසට පෙනෙන ආමිස ප්‍රධාන වශයෙන් හතරක් වුවද ඇසට නොපෙනෙන නොසිතන ආමිස හයකි. එනම්, චක්ඛු (ඇස) සෝත (කණ) ඝාණ (නාසය) ජිව්හා (දිව) කාය (ශරීරය ) මන (මනස) මේ හයට පිළිවෙලින් රූප , ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්මාරම්මන වශයෙන් ආමිසයන් අවශ්‍ය වේ. මෙම හය අප නොසිතන බුදු නුවනට පෙනුනු ආමිසයයි.

රූප නැතිනම්, ඇස නොපවතී ශබ්ද නැත්නම් කණ නොපවතී. ගන්ධ (ගඳ /සුවඳ) නැතිනම් නහය නොපවතී. රස නැතිනම් දිව අවශ්‍ය නැහැ. ශරීරය නැති නම් පහසක් නැත. අරමුණු නැතිනම් මනසක් අවශ්‍ය නැහැ. පහලවීමක් නැහැ. ඉහත කීවේ ලෝකාමිසයයි. ඒවා දුරුකළ විට නැවත නැවත පහල නොවන විට ලෝකයද නැවත නැවත පහල වීමක් නැත එය ශාන්තියයි. එය නියම සැපයයි. එහි විඳීමක් විඳින්නෙක් නැත. ඒ නිසා දුකක්ද නැත. දේවතාවා සිතුවේ මතුපිටට පෙනෙන දුක සහ සැපය ගැන පමණකි. එහි කෙළවරක් නැත බුදු හිමියන් ඉහතකී බියෙන්, මරණයෙන්, කාලයෙන් මිදීමට නම් එයට හේතුවන්නාවූ දොස සහමුලින් ඉවත් කිරීම නම්වූ ලෝකය පැවැත්මට හේතුව හෙවත් ලෝකාමිසය අත්හල යුතු බව අවධාරණය කොට දේශනා කළ සේක.

ඒ සමගම මරණයේ බිය දකින කාරණය තේරුම ගත යුතුය. දෙවියන්ටද බිය ශෝකය දැනෙනුයේ එතනයි. "වයෝ ගුණා අනුපුබ්බං ජහනති " උපන්දා පටන් කාලය ක්ෂණයක් පාසා ගෙවේ. (වයස ගෙවෙනවා) ඒ එක්කම ජරාව හෙවත් දිරීම් තත්වය ඇති වෙනවා. කොටින් කිවහොත් මවු කුසෙහිදීද දරුගැබ මෝරනවා යනු දිරීම බව නුවනින් වටහා ගත යුතුයි. එතැන් පටන් මැරෙන තුරුම දිරනව. එය අඛණ්ඩව සිදුවෙනවා. එම ස්වභාවයෙන් මිදීමට පින් කිරීම පිළිවෙත නොවන බව බුදු හිමියන් පෙන්වා දෙනවා. පින් කිරීම අවශ්‍ය වන්නේ ලෝකය හෙවත් ස්කන්ධ පංචකය හැදෙන හැදෙන වාරයක් පාසා පැවැත්වීම සඳහාය. ගින්නට පිදුරු මෙනි. පිදුරු දමන තරමට ගින්න පත්තුවේ. අප සසර ගමන් කරනවා යනු ඉතා භයානක ගමනකි. මෙයට හසුවී ඉපදෙමින් ලෝකාමිසය ගොඩනගමින් මැරෙමින් යන මෙම ගමනෙහි අනතුර මෙතෙකැයි කිව නොහැක. බුදු හිමියන් වදාළේ සතර අපායේ වැටි වැටී යන සත්වයා තමන්ගේ කැමැත්තට සසර දුක් සහිත ගමනක නොයෙදෙන බවයි. ඇහැට නොපෙනෙන දෙවියෙකුගේ හෝ කිසිදු බලවේගයකින් යන ගමනක් නොවන බවයි. ඉබේට කෙරෙනදෙයකුත් නොවේ. බුදු හිමියන් වදාළ පටිච්ච සමුප්පාදයට අනුව හේතුන් නිසා හැදෙන ඵලයන්ගේ ක්‍රියාකාරීත්වයට අනුව සත්වයා කැමැති වුවද අකමැති වුවද මේ සසර ගමන දිගින් දිගටම ගමන් කරන බවකි.

ගතවූ වස්තුන් මාසයයෙන් පසු අප රට වාසී බෞද්ධයින් මාසයක් කඨින පින්කම් සිදුකොට මෙම පුර පොහොයෙන් අවසන් කරනව. එහිදී විවිධ ආකාරයෙන් පින්කම් සිදුකරන, සිදුකළ අප ඒ හැම

පින්කමක්ම සිදු කරද්දී මේ කාරණයත් සිතිය යුතුමය. එසේ නැති විට තෙරුවන් සරණගිය ආර්යශ්‍රාවක මාර්ගයෙන් අප ඉවත්වී වෙනත් අනාර්ය මාර්ගයකට වැටෙනව පින්කළ යුතු බව ඉහත පැහැදිලි වුනා. ඒත් සමහර බෞද්ධයෝ මේ ගැන නොසිතා කටයුතු කරනව. සැලකිලිමත් විය යුතුයි. පෘතග්ජන පුද්ගලයින් වන අපි නිතරම පුරුදු වී ඉන්නේ රැස්කරන්නයි අත්හැරීමට පුරුදු වෙන්නෙ නැහැ. එකතු කර තරමට දියුණුයි කියලයි හිතෙන්නේ. ඒ අය දන්නේ නැහැ ගොඩ නගාගත්තු තරමට එකතුකර තරමටම ඒවා විදින බව, විදින තරමටම දුකක් බව, ඉහත දැක්වෙන දේවතාවාටද කොතරම් පින්තිබුනද , මරණයේ බිය දැනී තිබෙනව. ඒ සඳහා සිතූ පිළියම වැරදි එකක්. මනුෂ්‍යයින් වන අපට මෙම බිය ඊටත් වඩා දැනෙන්න ඕන. මහා පින්කම් කරනව වගේම ලෝකයේ පැවැත්මට දුකට බියට හේතුව වන සත්වයාගේ නියම ප්‍රතිරූප දැන ගන්නා සත්‍ය වටහා ගත යුතුය. එසේ නොවී පින්කම් පමණක් කරමින් එම සැප විපාක විදීමම දුකක් මිත්‍යාවක් බව වටහා ගත යුතුයි. කුසලය අකුසලයට හේතුවනවා යනු එයයි.

තථාගත දේශණාවට අනුව ශාන්තිය ලැබීමට නම් ධර්මයද එතෙරවීමට භාවිතාකොට එයද අත්හැරිය යුතුයි. අධර්මය අත් හැරීම ගැන එවිට කථා කරන්න දෙයක් නැහැ. රහතන් වහන්සේලා පින් පව් පමණක් නෙවි ධර්මයද අත්හැරී කෙනෙක් . ඊට හේතුව ධර්මයද අල්ලා ගැනීමට භාවිතා කරන්නක් නොවේ. එතෙර වීමට පමණි. පුහුදුන් ලෝකයාට එතෙරවීමට දේශණාකරන ලද්දකි.

අල්ලාගැනීමට පෙළඹෙන්නේ මමත්වය නිසා සංසාරික පුරුද්ද එයම නිසාය.

අද ශාසනය කෙසේ හෝ විකාශය වීමේ වේගය වැඩිවූ කාලයකයි අපි මේ ජීවත්වෙන්නේ. කොයි දෙයක වුනත් වේගය වැඩිවීම විනාශයයි. ශාසන ප්‍රතිපත්තීන්ද අධිවේගයේ නොදුව විය යුතුයි. අධිවේගයෙන් යන විට අවට පරිසරය නොපෙනී යයි. ගමන්කරන්නෙ කොහේද කියා තේරුම්ගන්නත් අමාරුයි. එකවරම නවතින්නද හොඳ නැහැ. ඊට පිළිවෙළ බුදු හිමියන් දේශණාකර තිබෙනව එයින් තමන්ටත් අනුන්ටත් යහපතක්ම සිදුවෙනවා. එවිට ලෝකයේ අපරාධ අඩු වෙනවා. පින් කරන්න ගිහින් ඇතැමුන් පව් කරගන්නේ එහෙමයි. ඉහත කී ජාති , ජරා, මරණ නම් වූ සිද්ධාන්ත තුන ලෝකයේ ක්‍රියාත්මක වන එකම බලය බව අමතක කරන නිසා කොයිතරම් පින්කරත් ලෝකය ගොඩනැගීමට හේතුවන්නා වූ ලෝකාමිසය අත් හැරීමට මග තමයි මේ දේශණා කර තිබෙන්නේ කියා කාරණය හරි ඉක්මනට අපි අමතක කරනවා. එවිට අපිට අරදේවතාවාට වාගේ පේනව. මරණයේ බියට විසඳුම පින් කිරීමයි යනුවෙන් ඉහත කී වේගය වැඩිවීම එතන සිදුවෙලා තියෙනවී

අද ලෝකය දෙස විමසිල්ලෙන් බලන කළ පේනව එදා දේවතාවාට නිසි විසඳුම නොදැනුනත් මරණයේ බිය දැනුන බව අද ජීවත් වන ඇතැම් මනුෂ්‍යයින්ට මරණයේ බියත් නොදැනේ. මේ හේතුව නිසා තමයි වැඩියෙන්ම සත්වයින් දුගතියෙ උපදින්නේ . මනුස්ස චුති සූත්‍රයේදී පොළොවේ පස් ටිකක් තමන්වහන්සේගේ නියසිළ මතට ගෙන නිය සිල මත තිබෙන පස් සහ පොළොවේ තිබෙන පස් උපමාවටගෙන දුගතියේ උපදින සත්වයින් පොලවේ පසට සමාන කළේ දුගතිය සත්වයාට මහගෙදර ලෙසට පුරුදු නිසාය. අපි දන්නවා ජීවිතේ වැඩි කාලයක් මහගෙදර ඇසුරු කරගෙනයි අප ජීවත් වෙන්නේ. ගෙදරින් පිට වුනත් නිතරම කල්පනාව ගෙදර ගැනයි. ඒ වාගේයි සංසාර ගමන තුළ ගමන්කරන පුහුදුන් සත්වයාට සතර අපාය මහගෙදර ලෙසට දැනෙනව. ඊට පසුබිම කර්මශක්තිය තුළින් ඇතිකරන බව වදාළහ.

අපි අපේ ජීවිත දිහා මොහොතක් කල්පනා කරලා බැලුවොත් පේනවා දේවතාව දැක්ක බියත් බුදුහිමියන් ඊට දුන් පිළිතුරත් අනුව ඒ අනතුර අප හැම කෙනෙක්ගේම ජීවිත වල තිබෙන බව. අප

කොයිතරම් පින්දහම් සිදුකරත් ඇඳපැළඳ, රන්රිදී, මුතු මැණික්, යාන වාහන දූදරුවන් ගොඩනගා ගත්තත් ඒ සතුට හැමදාම පවත්වන්න උත්සාහ ගත්තත් මරණයේ දුකට ඇති නැති උස් පහත් වයසේ භේදය ආදී කිසිවක් බල නොපාන බව කොයි මොහොතේ හෝ තිරිසන් ලෝකෙ තිරිසනුන් අතර පෙරේත ලෝකේ පෙරේතයන් අතර දිව්‍ය ලෝකෙ දෙවියන් අතර මිනිස් ලෝකයේ බ්‍රහ්ම ලෝකේ ආදී වශයෙන් ඉපදුනත් කාලයෙන් සහ මරණයෙන් මිදීමක් නොවන බව , ඒ නිසා පින් දහම්